www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## අමතර 8200ක හමුදාවක් හා ඩොලර් බිලියන 3.2ක් ඉල්ලුම් කරමින් -

# බුෂ් යුද වියදම් යෝජනාව පිලිබඳ ඩිමොක්‍රැටික් කයිවාරු ඉවතලයි

## Demands additional 8,200 troops, $3.2 billion
## Bush calls Democrats bluff on war funding resolution

**බිල් වැන් ඕකන් විසිනි**
**2007 මාර්තු 13**

කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටික් නායකත්වයට ප්‍රකෝපකාරී ලෙස අභියෝග කරමින්, සිය ලතින් ඇමරිකානු සංචාරය අතරතුර ජනාධිපති ජෝර්ජ් බුෂ් නිවේදනය කලේ ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ යුද්ධ උත්සන්න කිරීම සඳහා වියදම් වසයෙන් ඩොලර් බිලියන 3.2ක් ඉල්ලා සිටින බවත් 8200ක අතිරේක හමුදාවක් එහි යවන බවත් ය.

"සැබැවින් ම මගේ බලාපොරොත්තුව වන්නේ සටන් වැදී සිටින හමුදාවන්ට ඔවුන්ගේ රාජකාරිය ඉටු කල හැකි වන පරිදි කොන්දේසි නොපනවා අවශ්‍ය අරමුදල් කොන්ග්‍රසයෙන් සැපයෙනු ඇති බව" යි පසු ගිය 11 දින කොලොම්බියාවේ බොගෝටා හි මාධ්‍ය හමුවක දී බුෂ් කියා සිටියේ ය. ඉරාකයේ සටන්වැද සිටින එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමේ දින වකවානු යෝජනා කරමින් ඩිමොක්‍රැටිකයන් යොදාගන්නා භාෂාව, බිලියන 100 පරිපූරක අරමුදල් පනතට ඇතුල් කරන ඕනෑ ම සංස්කරනයකට නිෂේධ බලය යෙදීමට පාලනාධිකාරය සූදානම්ව සිටින බව ධවල මන්දිර නිලධාරින් අඟවා ඇත.

බැග්ඩෑඩයට හා අවශේෂ අන්බාර් ප්‍රාන්තයට මර්දනකාරී ප්‍රහාරයක් අරමුනු කොට ගත් ජෝර්ජ් බුෂ්ගේ ඊනියා කඩාවැදීමේ කොටසක් ලෙස ඔහු ජනවාරියේ දී නියෝග කල 21,500 කින් හමුදාව තර කිරීමට අමතරව අතිරේක 4100ක හමුදාවක් ඉරාකයට යැවීමට පරිපාලනය තීරනය කර ඇතැයි කලින් පලවූ වාර්තා ඔහුගේ නිවේදනය මතින් සනාථ කෙරෙයි.

ආක්‍රමනික හමුදාව විසින් සිදු කල මෙහෙයුම්වල දී අත්අඩංගුවට ගත් දස දහස් ගනනක් වූ ඉරාක සිවිල් වැසියන් පාලනය කිරීම සඳහා එක්සත් ජනපද අන දෙන නිලධාරීන් ඉල්ලා සිටි පරිදි 2200ක මිලිටරි පොලිස් භටයන් ද සහායක බලඇනි ද මෙම හමුදා තර කිරීමට ඇතුලත් ය.

නිවේදනයේ මවිතයට පත් කරන කාරනය නම් ඇෆ්ඝනිස්ථානය තුල තීව්‍ර වන ප්‍රහාරයකට මුහුනපා සිටින එක්සත් ජනපදය ප්‍රමුඛ ආක්‍රමනික හමුදාවන් තර කිරීම සඳහා 3,500ක අතිරේක බල ඇනි එහි යැවීමට යෝජනා කෙරී තිබීමයි. වර්ධනය වන ජාතික විරෝධතා ව්‍යාපාරයට මුහුන දීමට සූදානම් වන ඇෆ්ගන් මිලිටරිය හා පොලීසියට සහාය වන අතිරේක බලඇනි ගොඩනැගීමට කැප වූ මෙම හමුදාවන් "පුහුනු කිරීමේ" හා "කාවැද්දීමේ" දූත මෙහෙවරක කොටසක් බව බුෂ් කියා සිටියේ ය. හමුදා තර කිරීම මගින් ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද හමුදා භට සංඛ්‍යාව වසර පහහමාරකට පෙර එරට ආක්‍රමනය කල තැන් පටන් ඉහල ම මට්ටමකට නංවයි. වැඩිකල අරමුදලින් කොටසක් "නුදුරු අනාගතය සඳහා" තාවකාලිකව වැඩි කර ඇතැයි සඳහන් 3,200ක හමුදාව සඳහා වියදම් කෙරේ.

අතිරේක අරමුදල් ඉල්ලා ඩිමොක්‍රටික් පක්ෂයේ කථානායක නැන්සි පෙලෝසි වෙත යොමු කල ලිපියක බුෂ් මෙසේ සඳහන් කරයි. "ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදී හා ත්‍රස්තවාදයෙන් තොර සුරක්ෂිත ජාතීන් ගොඩනැගීමේ අරමුන සාක්ෂාත් කර ගැනීමට හමුදා නායකයන් තක්සේරු කර ඇති ආකාරයට සම්පත් යෙදවීම සාර්ථක කර ගැනීම සඳහා මෙම සංශෝධිත ඉල්ලීම ඉදිරිපත් කෙරේ."

මේ අතර, කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටික් නායකයන් "අපගේ හමුදාවන්ට උදව් කිරීමට" අසමත් වීම මගින් "සතුරාට" උදව් කරන බවට චෝදනා කරමින් දඩයම්කාරී දක්ෂිනාංශික ප්‍රහාරයක් එල්ල කරන උප ජනාධිපති රිචඩ් චේනි, බුෂ්ගේ ප්‍රකාශයන්ට තල්ලුව දුන්නේ ය.

"හෙමින් ලේ ගැලීමට සැලැස්වීම" ලෙස දැක්විය හැකි යුද විරෝධී මූලෝපායක් අනුගමනය කරන විට කොන්ග්‍රස් සභිකයන් අපගේ හමුදාවන්ට සහාය නොදක්වන අතර ඔවුන් අවතක්සේරු කරයි." යනුවෙන් ඉරාක යුද්ධයේ උද්වේගකර ආධාරකරුවෙක් හා ප්‍රමුඛ ඊස්රායල් මත ධාරී සංවිධානයක් වන ඇමරිකානු ඊස්රායල මහජන කටයුතු කමිටුව හමුවේ කථාකරමින් ඔහු පැවසී ය.

ජයග්‍රහනය ගැන නොව, කාල වකවානු, අවසන් දින හා අනෙකුත් අන්තනෝමතික පියවරයන් ගැන කථා කරනවිට සාමාජිකයන් සරලව ම සතුරාට කියන්නේ අප පිටව යනතෙක් වේලාව බලමින් සිටින

ලෙස ය"යි චේනි තවදුරටත් කියාසිටියේ ය. ඩිමොක්‍රැටිකයන් කොන්ග්‍රස් සභා දෙකම පාලනය කිරීම හා ඉරාක යුද්ධය අවසන් කිරීමට පක්ෂව බහුතර මහජන මතයක් තිබිය දීත් බුෂ්ගේ ඉල්ලීම් හා චේනිගේ බියවැද්දීම් ජයගනු ඇතැයි සෑම අතින්ම විශ්වාස කිරීමට හැකිය.

ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් මන්ඩලය ඇතුලත විවාදය කෙරීගෙන යද්දී එහි නායකත්වය, යුද අරමුදල් කපාහැරීමත්, මෙම වසර අවසානය වන විට ඉරාකයේ එක්සත් ජනපද හමුදා ඉවත් කිරීමට බලය පැවරෙන නීති සම්පාදනය කිරීමටත් සුලුතරය ගන්නා උත්සාහය නිෂ්ප්‍රභ කිරීමට උත්සුක වී සිටියි.

ඉරාක යුද්ධයටත් ඉරාකයේ මෙන්ම ඇෆ්ඝනිස්ථානයේ යුද්ධය තීව්‍ර කිරීමටත් දිගට ම අරමුදල් සැපයීම සඳහා බිලියන 123 තරම් වූ වැය ශීර්ෂයක් අනුමත කරවා ගැනීමේ නායකත්වයේ යෝජනාව පිලිබඳව කතානායක පෙලෝසි හා 35-40 අතර වන කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටික් "ලිබරලුන්" අතර මාර්තු දෙවන සතිය තුල පැවැත් වූ පැය තුනහමාරක රැස්වීම ගැන වොෂින්ටන් පෝස්ට්හි ජොනතන් වයිස්මාන් විසින් 11 දින වාර්තා කලේ ය.

කථානායකගේ "බාරකරුවා" ලෙස පෙනී සිටින, පෙලෝසි මෙන්ම කැලිෆෝනියානු ඩිමොක්‍රැටිකයෙක් වන ජෝර්ජ් මිලර් ගැන සඳහන් කරමින් වයිස්මාන් ලියන්නේ "මිලර්ගේ ස්වරය නිශ්චිත විය. ඉරාක පනත පරාජය කිරීමට ලිබරලුන් රිපබ්ලිකානුවන් සමග පෙල ගැසෙන්නේ නම්, කිසිදු ප්‍රතිපත්තිමය සීමාවකින් තොරව යුද්ධයට අරමුදල් සපයන පනතක් ගෙන ඒම හැර ඩිමොක්‍රැටික් නායකයන්ට වෙනත් විකල්පයක් නැත. බොහෝ ඩිමොක්‍රැටිකයන්ගේ හා රිපබ්ලිකානුවන්ගේ ඡන්දයෙන් එය ලෙහෙසියෙන් ම සම්මත වනු ඇත." යනුවෙනි.

මෙම තර්ජනය යුද්ධයට සහාය දක්වීම සඳහා කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටිකයන්ට මොන ම දේශපාලන කඩතුරාවක් හෝ ඉතිරි නොකිරීමට සමාන වන අතර, අපේක්ෂිත බලපෑම ඇති කරන බව පෙනී යයි.

එම රැස්වීමේදී ම "ඉරාකයෙන් පිටවෙනු දේශපාලන කන්ඩායමේ" අනුගාමික සාමාජිකයන්ට නිව්යෝර්ක් ඩිමොක්‍රැටික් නියෝජිත මොරිස් හින්චේ කියා ඇතැයි උපුටා දක්වන්නේ මෙසේ ය. "පෙලෝසිගේ යෝජනාව පරිදි සකස් කල මෙවන් පනතක් සම්මත කිරීමට අප අසමත් වන්නේ නම් විකල්පය බෙහෙවින් නරක එකක් වනු ඇත. එනම්, ජනාධිපති මහතානෙනි මෙන්න මුදල්. එය ඔබට අවශ්‍ය ඕනෑ ම ආකාරයකට වියදම් කරන්න යන ඍජු එකක් වනු ඇත. මෙම යෝජනාව සර්ව සම්පූර්න නැත. එහෙත් එය අපට අත් කර ගත හැකි දේ ට වඩා බෙහෙවින් ශුභදායී එකකි."

මේ සමානව ම නිව්යෝර්ක් හි "යුද විරෝධී" ඩිමොක්‍රැටිකයෙක් වන ජෙරොල්ඩ් නැඩ්ලර් උපුටා දක්වන ඇසෝසියේටඩ් ප්‍රෙස් වාර්තාව මෙසේ සඳහන් කරයි. "ඔබ ඕනෑවට වඩා දුරකට තල්ලුව දැමුවහොත් ඔබට කිසිවක් නොලැබෙනු ඇත. එය නොසෑහෙන්නේ යැයි මෙහි මිනිසුන් මට භාරදෙනු ඇත. එය අසම්පූර්න ය. සම්පූර්න යමක් අනුමත කර ගැනීමට සෑහෙන ඡන්ද අපට නැත. එබැවින් අපට ලබා ගත හැකි හොඳම දේ එයයි."

රිපබ්ලිකානුවන්ට එරෙහිව ඩිමොක්‍රැටිකයන්ට මුල්පෙලේ ජයග්‍රහනයක් අත් කර දුන් යුද විරෝධී මහජන මතය ප්‍රකාශිත වූ වාර මැද මැතිවරනයෙන් යන්තම් සිව් මසකට පසුව ඩිමොක්‍රැටිකයන්ට ලබාගත හැකි හොඳම දේ නම්, යුද්ධය ගෙනයෑමටත් එය තීව්‍ර කිරීමටත් බිලියන 100කට වැඩි මුදල් සම්භාරයක් සපයන පනතයි.

කෙසේ හෝ මෙම පියවර මගින් යුද්ධය අවසන් කිරීමට බුෂ්ට බල කෙරෙනු ඇතැයි යන ප්‍රකාශ මුලුමනින්ම වංචනික ය. පරිපූරක ඇස්තමේන්තුවට ගැටගසා ඇති කිසිදු කොන්දේසියකින් පරිපාලනයේ අත් බුරුලෙන් හෝ බැඳ දමන්නේ නැත. කොන්ග්‍රසය තුල බෙදාහරින ලද කෙටුම්පතෙහි අඩංගු හමුදා ඉවත් කිරීම පිලිබඳ "දින නියමකිරීම" පසුගිය මාසයේ දී කොන්ග්‍රසය විසින් සම්මත කල බුෂ්ගේ 21,500ක හමුදා "කඩාවැදීම" පිලි නොගැනීමේ සංකේතාත්මක යොජනාව සේ ම නොබැඳුරුම් වන්නේ දූත් ඩිමොක්‍රැටික් නායකත්වය මුදල් වෙන් කිරීමට යෝජනා කරන්නේ හරියට ම එම කඩාවැදීම සඳහා ම වීමෙනි.

"ඉරාකය තුල සටන් වැදී සිටින හමුදාවන් 2008 වන විට ඉවත් කිරීමට බල කෙරෙන" පියවරක් ලෙස මාධ්‍ය විසින් නිතිපතා එම නීතිය ගැන සඳහන් කරන අතර එය කිසිසේත්ම එවැන්නක් නොවේ. යථාර්ථය වන්නේ "හදිසි" වියදම් පනත සඳහන් කරනු ලබන ඉවත් කර ගැනීමේ "දින නියමයට" බොහෝ කලින්, එනම් සැප්තැම්බරයේ දී අහෝසි වීමට නියමිතව ඇති බවයි.

ප්‍රමානවත් පුහුනුවක් හා උපකරනවලින් තොර වූ ද කලින් යුද්ධයට මෙහෙයවන ලද එහෙත් ප්‍රකෘතියට පත් නොවූ හමුදා ඛන්ඩයන් යලි සේවයේ යෙදවීමෙන් පරිපාලනය හා පෙන්ටගනය වලක්වන්නේ යයි කියනු ලබන තවත් පියවරකට, අවශ්‍ය වන ඕනෑ ම අවස්ථාවක මෙම කොන්දේසි ඉක්මවා යන නියෝග පැනවීමට ධවල මන්දිරයට ලැබෙන සහතිකයක් ද ඇතුලත් වේ.

ඒ සමානව සෙනෙට්සභාව තුල දී, ඉරාකය තුල බලය යෙදීම සඳහා අධිකාරය පවරමින් 2002 දී සම්මත කල නීතිය අහෝසි කර එරටෙන් එක්සත් ජනපද හමුදා ඉවත් කිරීමේ අවසාන දිනය 2008 මාර්තු 31 ලෙස නියම කරන බවට ඩිමොක්‍රැටික් නායකත්වය කතාකරන අතර ම, එය අව්‍යාජ දින නියමයක් නොව හුදු අදහසක් පමනක් බව පැහැදිලි කිරීමට ප්‍රමුඛ ඩිමොක්‍රැටිකයන් වෙර දරති.

"එය අරමුනකි. එය දැඩි අවසන් දින නියමයක් නොවේ. එය අරමුනකි" යනුවෙන් 2008 ජනාධිපතිවරන අපේක්ෂක තරගයේ ඉදිරයෙන් ම සිටින නිව් යෝර්ක් ඩිමොක්‍රැටික් පක්ෂ සෙනේට් සභික හිලරි ක්ලින්ටන් *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයට පැවසුවා ය. "අපි ජනාධිපති වෙත පීඩනයක් එල්ල කිරීමට උත්සාහ කරනවා පමනි. මෙහි සම්පූර්න අර්ථය එයයි."

ඉන්ඩියානාහි ඩිමොක්‍රැටික් සෙනේට් සභික ඊවන් බායි ගෙන් උපුටා දක්වන *ටයිම්ස්* පත්‍රය ඩිමොක්‍රැටිකයන්ගේ ඉවත්කර ගැනීමේ යෝජිත දිනය "නම්‍යශීලිත්වයක් සහිත අරමුනක්" පමනක් බව අවධාරනය කරයි.

ඩිමොක්‍රැටික් නායකයන්ගේ කොන්දෙහි ඇති ඉමහත් නම්‍යශීලිත්වය, බුෂ් පරිපාලනය විසින් ගෙන යන ආක්‍රමනකාරී දේශපාලන ප්‍රහාරයට තියුනු ලෙසින් වෙනස් වෙයි. එක්සත් ජනපද ජනාධිපතිවරයෙක් ලෙස බුෂ්ට හිමි මහජන සහයෝගය එහි වාර්තාගත ගැඹුරකට ඇද දමමින් නොවැම්බර් මැතිවරනයෙන් පරාජය වූ රිපබ්ලිකානුවන් හා ඉන් ජයග්‍රහනය කල ඩිමොක්‍රැටිකයන්ගේ දේශපාලන සම්බන්ධතාවයේ ස්වභාවය යමෙකුට අදහාගැනීමට පවා නුපුලුවන.

ඩිමොක්‍රැටිකයන්ගේ ආස්ථානය තත්කාර්යවාදී දේශපාලනය පිලිබඳ කාරනයක් හෝ ධවලමන්දිරයට බලපෑම් කිරීමේ මූලෝපාය වර්ධනය කිරීමක් ලෙස පෙන්නුම් කිරීමට දරන සියලු උත්සාහයන් අවසානයේ දී යථාර්ථවත් පැහැදිලි කිරීමක් සම්පාදනය කරයි. එනම්, රිපබ්ලිකානුවන් මෙන් ම ඩිමොක්‍රැටික් පක්ෂය ද නියෝජනය කරන්නේ ඉරාක යුද්ධයේ නියම අරමුනු වන පර්සියන් ගල්ෆ් කලාපයේ තෙල් සම්පත්වල පාලනය අල්ලා ගැනීමට අඛන්ඩව සහාය දක්වන පාලක ඇමරිකානු ප්‍රභූ සංස්ථාපිතය බවයි.

යුද්ධය ගෙන යන ආකාරය හෝ අනුගමනය කරන ක්‍රමවේදයන් පිලිබඳව බුෂ් පරිපාලනය සමග කුමන වෙනස්කම් පැවතියේ වී නමුත් ඉරාකය තුල ගැඹුරුවන මරාලයෙන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මුදාගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයේ දී ඩිමොක්‍රැටික් නායකත්වය ඉරාක "ජයග්‍රහනයට" කැපවී සිටිති. එහි අර්ථය වන්නේ ඉරාක ප්‍රතිරෝධය මඩිමින් කලාපයේ එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටුවා ගැනීමේ අරමුන සාක්ෂාත් කර ගැනීමයි.

තමන් ඉරාක යුද්ධයේ විරුද්ධවාදීන් ලෙස පෙන්වා ගැනීමට මාධ්‍යයේ ද අනුකූලතාවය ඇතිව ඩිමොක්‍රැටිකයන් දරන උත්සාහය තිබියදී ම, කොන්ග්‍රසය තුල පක්ෂ නායකත්වය විසින් බෙදා හරින ලද යෝජනාවල ඉරාකයෙන් එක්සත් ජනපද හමුදා මුලුමනින් ම ඉවත් කිරීමක් අඩංගුකර නොගනියි.

මිචිගන් ඩිමොක්‍රැටික් සෙනෙට් සභික කාර්ල් ලෙවින් 10 වැනි දින *වොෂින්ටන් පෝස්ට්* පත්‍රයට කියා සිටි පරිදි සෙනේට් සභාවේ ඩිමොක්‍රැටික් නායකත්වය විසින් කෙටුම්පත් කල යෝජනාවලියෙහි "ඉතිරිව ඇති සීමිත හා විශේෂිත කර්තව්‍යයන් සඳහා අවශ්‍ය නොවන සියලු හමුදාවන් ඉවත් කිරීම සඳහා නිශ්චිත දිනයක් රහිත අරමුනක් ඇතුලත් ය."

"ඉතිරිව ඇති සීමිත කර්තව්‍යයන්" පුවත්පතෙහි විස්තර කරන්නේ "ආරක්ෂාව, පුහුනු කටයුතු හා ත්‍රස්ත විරෝධී මෙහෙයුම්" ලෙස ය. මෙහි අර්ථය වන්නේ දස දහස් ගනනක් ඇමරිකානු හමුදාවන් ඉරාකය තුල රැඳී සිටිමින්, දැනටමත් ලක්ෂ ගනනක් ඉරාකීයන්ගේ ජීවිත බිලිගත් මිනීමරු ප්‍රහාරයන් ගෙන යන බවත් රටේ තෙල් බිම්වල එක්සත් ජනපද පාලනය "සුරක්ෂිත" කරන බවත් ය.

ඔවුන්ගේ සියලු පුහු යුද විරෝධී කයිවාරු තිබියදී ම ඩිමොක්‍රැටික් පාලනයේ පවතින කොන්ග්‍රසය, ඉරාක යුද්ධය උත්සන්න කිරීම සඳහා පාලනාධිකාරයට බිලියන 100කට වැඩි ප්‍රදානයක් කිරීමට යයි. කොන්ග්‍රසයේ මුදල් වෙන් කිරීමේ විවාදය හා ඡන්දය මාර්තු තෙවැනි සතිය තරම් නුදුරේදී ම සිදුවනු ඇත.

ඉරාක ජනතාව මැඩීම සාහසික ලෙස වේගවත් කිරීම සඳහා මෙම මුදල් වැය කරනු ඇත. ටික්‍රිට් නගරය අසල ඉරාක ගම්මානයකට එරෙහිව දෙවැනි සතියේ දී 82වැනි ගගන සේනාංකය විසින් සිදු කල ආක්‍රමනයක විස්තර ඇතුලත් 12 දින පලවූ *වෝල්ස්ට්‍රීට් ජර්නලයේ* ලිපියක ඇඟ කිලිපොලන තොරතුරු ඇතුලත් විය.

ප්‍රහාරක හෙලිකොප්ටර් තුනක් හා හම්වී යුද ටැංකි දුසිමකට වැඩි ගනනක් මෙහෙයවා කල ආක්‍රමනයේ එල්ලය විරෝධතා ව්‍යාපාරයේ "මධ්‍යම මට්ටමේ සිව් දෙනෙක් මරා හෝ පන පිටින් අල්ලා ගැනීම" බවත් ඔත්තුකරුවෙකුගෙන් දැනගත් පරිදි ඔවුන් මෙම ගම්මානයේ ජීවත් වන බවත් යනාදී විස්තර එහි ඇතුලත් විය.

"එක්සත් ජනපද හමුදා ගෙවල් තුලට කඩා වැදී නිවැසියන් මෙල්ල කලහ. ඉලක්ක කල නිවාසවල සිටියවුන් වයස හා ස්ත්‍රී පුරුෂභාවය මත වර්ගකර වැඩිහිටියන් දනගස්වා ඇස් බැඳ ප්ලාස්ටික් මාංචු දැමූහ. නිලධාරියෙක්, හිරකාරයන් ලෙස පසුව හඳුනාගැනීමට පහසුවන පරිදි ඔවුන්ගේ නලල් මත නොම්මර යෙදී ය."

අවසානයේ දී තමන් පැමින ඇත්තේ වැරදි ගම්මානයකට බව එක්සත් ජනපද හමුදාවන්ට වැටහුනේ පසුව බව එහි සඳහන් විය. වැරදී ගිය ආක්‍රමනය මිලිටරිය විසින් නම් කොට තිබුනේ " ඔපරේෂන් ෆීනික්ස්" නමිනි. එය වියට්නාම් යුද්ධය අවධියේ දී 20,000-40,000 අතර වියට්නාම් වැසියන් ඝාතනය කලා වූ එක්සත් ජනපද මිලිටරිය හා සීඅයිඒ සංවිධානය එක්ව ගෙනගිය ඝාතන වැඩ පිලිවෙලේ නම යි.



© www.wsws.org